# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# මහජන ආරක්ෂක අමාත්‍යාංශය
# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# ලංසු සඳහා ආරාධනයයි

## වසරක කාලයක් සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ VX Rail Cluster Server පද්ධති 04 ක් සේවා හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා වන ප්‍රසම්පාදනය

### කොන්ත්‍රාත් (IFB) අංකය : DIE/PRO/07/2017/36-VOL-III

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් වසරක කාලයක් සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ VX Rail Cluster Server පද්ධති 04 ක් සේවා හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා වන ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.
2. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.
3. ආපසු ගෙවනු නොලබන රුපියල් පන්දහසක (ලංකා රු. 5,000.00) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව **2023.07.07** වෙනි දින සිට **2023.07.28** වෙනි දින දක්වා රාජකාරී දිනයන් හි **පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර** බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ "සුහුරුපාය" 5 වන මහලේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශයේ නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් ක්‍රමය මුදලිනි.
4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු රාජකාරී දිනයන්හි **පෙ.ව.9.00 හා ප.ව. 3.00 අතර** දුරකථන අංක 0112-101559 ඔස්සේ ලබාගත හැකිය. 2023.07.07 **වෙනි දින සිට** 2023.07.28 වෙනි දින දක්වා ඉහත 3 වන ඡේදයේ සඳහන් ලිපිනයේදී හෝ දෙපාර්තමේන්තුවේ (**www.immigration.gov.lk**) වෙබ් අඩවියේ ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.
5. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු "**මුල් පිටපත**" හා "**අනු පිටපත**" ලෙස සකස් කර වෙන් වෙන් වශයෙන් කවරවල බහා එම කවර දෙක නැවත තනි කවරයක බහා මුද්‍රා තබා එහි වම්පස ඉහළ කෙලවරේ අදාළ කොන්ත්‍රාත්තුවේ නම සහ IFB අංකය පැහැදිලි සඳහන් කර 2023.07.31 **වෙනි දින ප.ව. 2.00** ට හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ 3 ඡේදයේ සඳහන් ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකිය. ලංසු භාරගැනීම සඳහා වන අවසාන දිනයේ සිට හෝ ගැනුම්කරු විසින් දීර්ඝ කරනු ලබන දිනයේ සිට **දින හැත්තෑ හතක් (77)** ලංසු වලංගු විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

   සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
   ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
   05 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.

6. පූර්ව ලංසු රැස්වීමක් 2023.07.18 වෙනි දින 14.00 පැයේදී බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ, "සුහුරුපාය", 5 වන මහලේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දී පැවැත්වේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**05 වන මහල, "සුහුරුපාය",**
**ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.**